# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 10 දරන ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 75 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 10 දරන ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1987 මාර්තු මස 13 වන දින.]

එල්. ඩී.—ඕ. 18/86

**ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ව්‍යාපාරයක්, එහි සාමාජිකාවන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව, ඒ ව්‍යාපාරයට අදාළ සියලු පරමාර්ථ සහ කරුණු සාර්ථක ලෙස ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ආරම්භ කොට මෙතෙක් කල් පිහිටුවා ගෙන ඇති හෙයින් ද: පූර්විකාව.

ඒ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ කවර පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ ව්‍යාපාරය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ ව්‍යාපාරය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 10 දරන ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට සහ ඉන්පසු (මෙහි මින්මතු "ව්‍යාපාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, "ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එහි සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි වන්නේ ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ අරභයා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ආණ්ඩුවේ නියෝජ්‍යායතනවල හෝ පොදු වුවද පෞද්ගලික වුවද ජාත්‍යන්තර නියෝජ්‍යායතනවල, ආයතනවල සහ වෙනත් සංවිධානවල සහයෝගය ඇතිව, සාමාජිකත්වය, ඒකක, කණ්ඩායම් සහ ක්‍රියාකාරී බල මූළ මගින් ජාතික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම;

(ආ) ජාතික ප්‍රතිපත්තියේ සහ දැනට පවත්නා පොදු කාර්ය සංවිධානයේ රාමුව තුළ පිහිටා ජනතාවට සේවා සැලසීම පහසු කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩ පිළිවෙළවල් සංවර්ධනය කිරීම;

2—ඒ 089466—7,210 (86/03)

(ඇ) සේවා සැලසීමට බාධකව පවත්නා ගැටළු සහ සංරෝධන විසඳීමට අවශ්‍ය වන සම්බන්ධතා, දේශපාලන නායකත්වය සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර ඇති කර ගැනීම ;

(ඈ) කාන්තාවන්ගේ, ළමයින්ගේ සහ තරුණයන්ගේ අභිවෘද්ධිය ගැන විශේෂ සැලකිල්ලෙන් යුතුව ඔවුන්ගේ ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සමාජයීය සංවර්ධනයක් ඇතිවීම නිසැක වන ආකාරයට ඔවුන්ගේ යහපත නංවාලීම සහ ඔවුන්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් සහ ඔවුන්ට අමුතු අන්දමකට සැලකීමෙන් ඔවුන් ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන, කාලීන පොදු කටයුතු පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යාම ;

(ඉ) විමර්ශණවලදී අනාවරණය කරගනු ලැබූ කරුණු උචිත බලධරයන් වෙත ඉදිරිපත් කිරීම සහ අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීමට ඉල්ලා සිටීම ;

(ඊ) ජාතික සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන ඒකීය කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට කාන්තාවන්ට හැකි වන සේ ජාති, ආගම්, භාෂා, රැකියා සහ දේශපාලන මත භේදවලින් තොරව සියලුම සාමාජිකයන් අතර සහයෝගතාව සහ අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීම ;

(උ) සිය නිවාසයෙන් බාහිරව සංවර්ධන කටයුතුවලට කාන්තාවන් සක්‍රීයව සහභාගි කරවා ගැනීමට වග බලා ගැනීම ;

(ඌ) විධි පූර්වක සහ විධි පූර්වක නොවන අධ්‍යාපන ආයතන, සමූපකාර සහ සමාජ ශුභ සාධක ව්‍යාපෘති සහ වෙනත් එවැනි ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා සංස්ථාවේ සංවර්ධන ප්‍රයත්නයෙහි ලා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ක්‍රියාශීලීව ආයාචනය කිරීම සහ ලබා ගැනීම ;

(එ) කාන්තා කාර්යාංශය, ළමා ලේකම් කාර්යාලය, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජ්‍යායතන සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් කාන්තාවන්ට සහ ළමයින්ට සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, අධ්‍යයන කිරීම සහ දත්ත රැස්කිරීම ;

(ඒ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ආනුෂංගික හෝ හිතකර අනෙකුත් සියළුම ක්‍රියා සහ දේවල් සිදු කිරීම :

එසේ වුවද එවැනි සියලු කාර්යයන් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම වනිතා කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කළ යුත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ ක්‍රියාකාරී කමිටුව විසින්, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය. එකී ක්‍රියාකාරී කමිටුව එකී රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන හා එකී රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සංඛ්‍යාවකින් යුත් සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ ව්‍යාපාරයේ ක්‍රියාකාරී කමිටුව සංස්ථාවේ ප්‍රථම ක්‍රියාකාරී කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති

5. (1) සාමාජිකයන් ඇතුළු කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් විශ්‍රාම ගැනීම හෝ ඔවුන් නෙරපීම සඳහාත් සාමාජික ලේඛනය පවත්වාගෙන යාම සඳහාත් සංස්ථාවේ ක්‍රියාකාරී කමිටුවේ සහ සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සඳහාත් සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහාත් සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාත් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් අතුරෙන් තුනෙන් දෙකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබූ කල්හි, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම, ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

6. සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් ප්‍රමාණ පිළිබඳ නිසි ගිණුම් තැබීමට සංස්ථාවේ ක්‍රියාකාරී කමිටුව විසින් කටයුතු සැලැස්විය යුතු ය. යථා පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් විසින් සංස්ථාවේ ගිණුම් සටහන් පිරිසෙයින් වර්ෂයකට වරක් පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, අයවැය ගිණුමේ සහ ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව ඒ විගණකවරයා හෝ විගණකවරුන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

ව්‍යාපාරය විසින් ගෙවිය යුතු සහ ව්‍යාපාරයට ගෙවනු ලැබිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති ව්‍යාපාරයේ සියලු ණය සහ වගකීම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර ව්‍යාපාරයට අය විය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු සියළු මුදල් හා සම්මාදම්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුදල් සහ දේපළ යෙදිය යුතු ආකාරය.

8. කවරාකාරයකින් වුවද සංස්ථාව වෙත ලැබී ඇති මුදල් සහ දේපළ මෙහි දක්වා ඇති පරමාර්ථ ඉටු කරගැනීමේ කාර්ය සඳහා ම පමණක් යෙදිය යුතු අතර, ඒවායින් කිසිදු කොටසක් ලාභාංශ වශයෙන් හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ ලාභ වශයෙන් වූ වෙනත් කවර ආකාරයකින් හෝ කෙළින්ම නැතහොත් අන් ලෙසකින් සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකරනු ලැබිය යුතු ය:

එසේ වුවද, මේ පනතේ අඩංගු විධිවිධාන කිසිවකින් පහත දැක්වෙන දේ වළක්වාලීමක් නොසිදුවන බව සැලකිය යුතු ය:—

(අ) සංස්ථාව වෙත සලසන ලද යම් සේවයක් සම්බන්ධයෙන් යුක්තිසහගත වූද නිසියාකාර වූද යම් පාරිශ්‍රමිකයක් සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ සංස්ථාවේ සාමාජිකයකුට යහ අධ්‍යාශයෙන් ගෙවීම;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයෙකු කොටස්කරුවකු ව සිටින යම් සමාගමක් විසින් හෝ සංස්ථාවට කුලියට දෙන ලද යම් ස්ථානයක් සඳහා යුක්තිසහගත සහ නිසි ගෙවල් කුලියක් ගෙවීම;

(ඇ) සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයෙකු විසින් තම කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී නැතහොත් සංස්ථාවේ පරමාර්ථ කුළුගැන්වීමේ දී ක්‍රියාකාරී කමිටුවේ පූර්ව අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත සහ නිසි වියදම් ප්‍රතිපූරණය කිරීම හෝ ආපසු ගෙවීම.

දේපළ දැරීමට සංස්ථාව සතු බලය.

9. මිලට ගැනීමක්, ප්‍රදානය කිරීමක්, තෑගි කිරීමක්, බද්දක් හෝ අන්තිම කැමැති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර නැතහොත් අන් කවරාකාරයකින් වුවද සංස්ථාව වෙත සතු වන චංචල හෝ නිශ්චල දේපළ භාරගැනීමට සහ වැඩදායී අයිතිකරු වශයෙන් හෝ භාරකරු වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය. එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව සංස්ථාව විසින් දැරිය යුතු අතර, (භාරවලට සහ අදාළ නියාදන සාධන පත්‍රවලට බල පාන යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව) එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් අන් දමකින් නියාදනය කිරීමේ, පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

**10.** පහත සඳහන් දේ සඳහා සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය:—

දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම, ණය ලබාගැනීම ආදිය සඳහා ඇති බලය.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් සහ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ අන්‍යාකාරයකින් ලබාගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ කුළුගැන්වීම පිණිස කොටගෙන සුදුසුයයි සලකනු ලබන පරිදි ඒ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා නියාදනය කිරීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල්, ක්‍රියාකාරී කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට ආයෝජනය කිරීම සහ එවැනි ආයෝජන කිසිවක් වෙනස් කිරීම සහ මාරු කිරීම ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා යම් ඇපයක් මත මුදල් ලබාගැනීම හෝ ණයට ගැනීම සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයට සුරක්ෂිත කිරීම හෝ මුදාලීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා සෑම වර්ගයකම දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ තෑගි ඉල්ලා සිටීම සහ භාර ගැනීම ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා ගොඩනැගිලි කිසිවක් ඉදිකිරීම, වෙනස් කිරීම හෝ නඩත්තු කිරීම ;

(ඊ) යම් පුණ්‍ය කාර්යයක් සඳහා මුදලින් දායකවීම හෝ ඇපවීම ;

(උ) සංස්ථාව සඳහා හෝ වෙනත් යම් පුණ්‍ය සංගමයක්, ආයතනයක්, සමිතියක් හෝ පුද්ගල මණ්ඩලයක් සඳහා හෝ වෙනත් යම් පුණ්‍ය භාරයක් සඳහා හෝ දරනු ලබන හෝ අයිති හෝ දැරීමට ඇති හෝ අයිතිවීමට ඇති යම් නිශ්චල දේපළකට නැතහොත් පෞද්ගලික දේපළකට බලපාන යම් නීත්‍යානුකූල භාරයක් භාරගැනීම, පිළිගැනීම, ලියාඅත්සන් කිරීම, ඉටුකිරීම සහ පරිපාලනය කිරීම ;

(ඌ) ප්‍රධාන කාර්යාලයක් පිහිටුවා පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකාවේ කවර වූවද කොටසක ශාඛා පිහිටුවීම සහ සංවිධානය කිරීම :

(එ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන වැටුප්, විශ්‍රාම වැටුප්, පාරිතෝෂික සහ දීමනා ඔවුන්ට ගෙවීම ;

(ඒ) සංස්ථාවේ සිටපු හෝ දැනට සේවය කරන නිලධරයන්ට හෝ සේවකයන්ට නැතහොත් ඔවුන්ගේ ඥාතීන්ට හෝ යැපෙන්නන්ට පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සඳහා යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් ඇතිකිරීම නැතහොත් එවැන්නකට දායකවීම ;

(ඬ) සංස්ථාවේ පරමාර්ථ කුළුගැන්වීම සඳහා යම් තැනැත්තකු, සමාගමක්, සමිතියක්, සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත නොකරනු ලැබූ පුද්ගල මණ්ඩලයක්, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් ගිවිසුමකට එළඹීම; සහ

(ඪ) සංස්ථාවේ පරමාර්ථ නිසියාකාරව සහ සාර්ථක ලෙස ඉටු කරගැනීම සඳහා අවශ්‍ය වන හෝ සුදුසු වන වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** ක්‍රියාකාරී කමිටුවේ යෝජනා සම්මුතියක බලය ප්‍රකාර සහ ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව කරනු ලැබිය යුතුය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**12.** සංස්ථාවේ යම් සාමාජිකයෙකුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවූ කිසිදු සම්මාදම් මුදලක්, සංස්ථාවේ ණය සහ වගකීම නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුවද කාර්යයක් සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමෙන් පසු ශේෂව ඇති දේපළ.

**13.** සංස්ථාව විසුරුවා හරින ලද අවස්ථාවක දී සියලු ණය සහ වගකීම් පියවීමෙන් පසු කවර වුවද දේපළක් ඉතුරු වී තිබේ නම් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, ඒ දේපළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට භාරදීම හෝ ආණ්ඩුව වෙත පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙනුවෙන්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ලබාගත හැකිය.